# 16 බුදු සිරිතයි - පරිසරයයි

අප අවට ඇති වටපිටාව පරිසරය ලෙස හැඳින්වෙන බව ඔබ දන්නා කරුණකි. එය ප්‍රධාන වශයෙන් දෙයාකාර ය. එනම්,

1. ජීව පරිසරය
2. අජීව පරිසරය යනුවෙනි.

මෙයින් ජීව පරිසරයට මිනිසා ඇතුළු සියලු සත්ත්ව සමූහයාත් නොමැරුණු තුරුලතා ආදියත් ඇතුළත් වේ. අජීව පරිසරයට අයත් වන්නේ වාතය, ජලය, හිරුඑළිය, පස, කඳු, හෙල්, පර්වත ආදියයි. මේ ජීව පරිසරය කෙරෙහි අජීව පරිසරය ද අජීව පරිසරය කෙරෙහි ජීව පරිසරය ද අන්‍යෝන්‍ය වශයෙන් බලපායි. මෙම පරිසර පද්ධති දෙක පවතිනුයේ එකිනෙකට උපකාර ව ය. මිනිසුන් සහිත ජීව පරිසරය විසින් අජීව පරිසරයේ යහ පැවැත්ම ද අජීව පරිසරය විසින් මිනිසුන් ඇතුළු ජීව පරිසරයේ යහපැවැත්ම ද ඇති කළ යුතු වෙයි.

මිනිසාගේ යුතුකම විය යුත්තේ පරිසරය ආරක්ෂා කිරීමයි. ඒ සඳහා පරිසරයට ආදරය කරන මිනිසුන් බිහි විය යුතු ය. මේ ලෝකයේ පරිසරයට හිතෛෂී ව කටයුතු කළ මිනිසුන් අතර ප්‍රමුඛත්වය හිමි වන්නේ බුදුරජාණන් වහන්සේට ය. බෝධිසත්ව චරිතය තුළිනුත්, බුද්ධ චරිතය තුළිනුත්, දේශනා කළ ධර්මය තුළිනුත් ජීව අජීව පරිසරය කෙරෙහි පැවති ළෙන්ගතුකම කොතෙක් ද යන්න වටහාගත හැකි ය. උපතේ සිට බුද්ධ පරිනිර්වාණය දක්වා වූ බුද්ධ චරිතය අධ්‍යයනය කරන්නෙකුට උන් වහන්සේ පරිසරය කෙරෙහි හිතානුකම්පී ව කටයුතු කළ අවස්ථා කොතෙකුත් හඳුනාගත හැකි ය.

සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපත සිදුවූයේ ලුම්බිනි නම් සල් උයනෙහි ය. එය කිඹුල්වත් නුවර හා දෙව්දහ නුවර අතර මාර්ගයේ පසෙක පැවති සොඳුරු පරිසර පද්ධතියකි. උන් වහන්සේගේ ළමා කාලය ගත වූයේ ද ස්වාභාවික පරිසරය ආශ්‍රය කරගෙන ය. වප් මඟුල් දින දඹ රුක් සෙවණේ සිසිලස ලබමින් බවුන් වැඩීමත්, දෙව්දත් කුමරුන් විසින් ඊයකින් විදින ලද හංසයෙකු මරණයෙන් ගලවා සුවපත් කොට නැවත පරිසරයට මුදාහැරීම සම්බන්ධ කතා ප්‍රවෘත්තියත් ඊට නිදසුන් ය. බෝසත් කුමරු තරුණ අවධියේ සෙසු රජ කුමාරවරුනුත් සමග වනයේ සුන්දරත්වය විඳීමට ගිය අවස්ථාවක ඔබ මොබ දුව පනින ගෝනුන් හා මුවන් දැක සතුටු වූ බව සඳහන් වෙයි. ඇතැම් කුමාරවරුන් ඔවුන් ලුහුබැඳ ගොස් කරන හිංසාවන් පිළිබඳ ව කළකිරී වහා මාළිගයට පැමිණියේ නැවත ඔවුන් සමග උයන් කෙළියෙහි නොයෙදීමට හා මිත්‍ර ඡන්න සමග පමණක් උයන් කෙළියෙහි යෙදී පරිසරයේ සුන්දරත්වය අත්විඳීමට සිතාගෙන ය.

සිදුහත් කුමරු ගිහිගෙය හැර ගොස් කිං කුසලගවේසී ව කටයුතු කළ වකවානුවේ දිවි ගෙවූයේ මිනිස් වාසයෙන් තොර නිසංසල පරිසර පද්ධතීන්හි ය. අවසානයේ බුද්ධත්වය සඳහා තෝරා ගන්නා ලද නේරංජනා නදී තීරය ගැන අරියපරියේසන සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ මෙසේ සඳහන් කර ඇත.

"මහණෙනි ඒ මම කුසලය නම් කුමක් දැයි සොයන සුලු වූයෙමි. මගධ දනව්වෙහි පිළිවෙළින් සැරිසරන්නෙමි, උරුවේලයෙහි සේනානි ගම වෙතැ පැමිණියෙමි. එහි වූ සිත්කලු භූමි භාගය ද සිත පහදවන වන ලැහැබ ද සුදු වැලිතලා මැදින් නිවී සැනසිල්ලේ ගලා බස්නා මහා තොටුපළින් යුත් මනරම් නේරංජනා නදිය ද එසේ ම හාත්පස වූ ගොදුරු ගම ද දුටුයෙමි. ඒ දුටු මට මේ අදහස් පහළ විය."

"මේ භූමි භාගය ඉතා රමණීයයි. වන ලැහැබ ඉතා ම ප්‍රසාදජනකයි. මනා තොට ඇති සුදු වැලිතලා මැදින් ගලන නදිය ද සිත් සනසවනසුලු වෙයි. හාත්පස සොඳුරු ගම ද වෙයි. පධන් වීර්යය වඩන කුල පුත්‍රයකුහට ඒ සඳහා මෙයට වඩා සුදුසු තවත් තැනක් නැතැයි මට සිත් විය."

බෝසත් චරිතය හා සම්බන්ධ වැදගත් සිදුවීම්වලට පසුබිම් වූයේ නිහඬ සොඳුරු පරිසරයකි. සුජාතා සිටු දියණියගේ කිරිපිඬු දානය පිළිගත් අජපල් නුග රුක පිහිටා තිබුණේ ද නිමල පරිසරයක ය. බෝසතුන්ට පැන් පහසුව ලබා දුන් නේරංජනා නදිය ද, බුදු බව ලැබීමට පෙර දින දිවා විහරණය ගත කළ භද්‍ර වනය ද සොඳුරු පරිසර පද්ධති විය.

බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණයෙන් අනතුරුව වසර හයක් අරියපරියේසනයෙහි යෙදුණේ වනගත ව ය. අවසානයේ උරුවෙල් දනව්වෙහි බෝධි පර්යංකයේ දී බුදුබව ලැබූහ. බුද්ධත්වයට පත් ව එම පරිසරයේ ම වැඩ වෙසෙමින් සත් සතියක් ගත කළහ.

දෙවන සතියේ උතුම් බුදුබව ලබා දීමට උපකාරී වූ ඇසතු බෝධි වෘක්ෂයට කෘතවේදීත්වය දක්වූයේ දින හතක් ඇසිපිය නොහෙළා ඒ දෙස බලා සිටීමෙනි. එය පරිසරයට පූජනීයත්වයක් ලබා දුන් ක්‍රියාකාරකමකි. එපමණක් නොව මෙමඟින් ලෝක සත්ත්වයනට අගනා පණිවිඩයක් ද ලබා දුනි. එනම් කළගුණ සැලකිය යුත්තේ මිනිසා ඇතුළු සත්ත්වයින්ට පමණක් නොවන බවයි. තමන්ට පිහිට වූ පරිසරයට ගරු කිරීමක් ද එයින් පිළිබිඹු වෙයි.

බුදුරජාණන් වහන්සේ පරිසරයට මිතුරු ව කටයුතු කළා සේ ම පරිසරය ද උන් වහන්සේට මිතුරු ව කටයුතු කළ අවස්ථා දැකගත හැකි ය. හය වන සතිය මුචලින්ද විල අසල වැඩවසන විට ඇද හැලුණු වර්ෂාවෙන් ආරක්ෂාව සැලසීමට මුචලින්ද නාගරාජයා ඉදිරිපත් වීම එයට එක් නිදසුනක් පමණි.

බුද්ධත්වයට පත් ව දිවි ගෙවූ වසර 45 ක කාලය තුළ දී බොහෝ විට උන් වහන්සේගේ වාසස්ථාන, දම් සභා මණ්ඩප, භාවනා අසපු, දාන ශාලා, විවේකය ගත කළ නිවස්නයන් වූයේ තුරු සෙවණ ය. උයන් වතු ය. ගංගා නදී තීරයන් ය. වැව් පොකුණු ය. ගිරි සිඛරයන් හා ගල් ලෙන් ය. කෙත් යායවල් ය. ඒ උන් වහන්සේ වෙනුවෙන් ඉදිවූ ආරාම නොතිබූ නිසා නොවේ. උන් වහන්සේ පරිසරයට දැක්වූ නික්ලේශී ඇල්ම නිසා ය.

බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිත ව වස් විසූ ස්ථාන සමහරක් මෙසේ ය.

- පළමු වන වස් කාලය : මුවන්ගේ අභය භූමියක් බවට පත් ව තිබූ බරණැස ඉසිපතන මිගදාය
- දෙවන, තෙවන හා සිව් වන වස් කාලයන් } : ලෙහෙණුන්ගේ අභය භූමියක පිහිටි වේළුවනාරාමයේ වැඩ වාසය කර ඇත. උණ ගසින් සැදි වනයක පිහිටි නිසා වේළුවනාරාමය නම් විය.
- පස් වන වස් කාලය : විශාලා මහනුවර කූටාගාර ලෙනෙහි
- හය වන වස් කාලය : මකුල පර්වතයෙහි
- අට වන වස් කාලය : භේෂකලා පර්වතයෙහි
- දහ වන වස් කාලය : පාරිලෙය්‍ය වනයෙහි වැඩ වසමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලැබීම
- දහතුන, දහඅට, දහනවය වස් කාලය : චාලිය පර්වතයෙහි වැඩ විසීම

ඉහත දක් වූ පරිදි වස් තුන් මාසය තුළ ද, ධර්ම ප්‍රචාරක සේවාවේ නියැලෙද්දී ද බුදුරජාණන් වහන්සේගේ විවේක ස්ථාන හා නේවාසික ස්ථාන බවට පත්වූයේ ද විවිධ පරිසර පද්ධතීන් ය. භද්දවග්ගිය කුමාරවරුන්ට මුණ ගැසුණේ ද බරණැස සිට උරුවේලාවට වඩින මාර්ගයෙහි පිහිටි කැප්පෙට්ටියා ලැහැබක විවේක සුවයෙන් පසු වන විට ය. බිම්බිසාර රජු බුදුරජාණන් වහන්සේ බැහැ දැකීමට පැමිණියේ රජගහ නුවරට සමීප තල් වනයක වැඩ සිටි අවස්ථාවක ය. කිඹුල්වතට වැඩි කල්හි මුල් දිනවල වාසය කළේ නිග්‍රෝධ ශාක්‍ය කුමාරයා සතු උයනෙහි ය. ශාක්‍ය කුමාරවරුවන්ගේ පැවිද්ද සිදු වූයේ අනෝමා නදී තීරයෙහි අනුපිය අඹ වනයෙහි විවේකී සුවයෙන් ගතකරන විට ය. සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමා මුලින් ම බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණේ රජගහනුවර සීත වනයෙහි වැඩ සිටිය දී ය.

ස්වාභාවික පරිසරය දම් සභා මණ්ඩප බවට කර ගත් තවත් අවස්ථා කිහිපයක්,

- ★ ඉසිපතනයේ මිගදායේ දී පළමු දම් දෙසුම පැවැත්වීම
- ★ ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහි (ඌරන් හෑරූ ලෙන) වැඩවසන විට වේදනා පරිග්‍රහ සූත්‍රය දේශනා කිරීම
- ★ ඉච්ඡානංගල වනයෙහි වැඩ සිටිය දී අම්බට්ඨ සූත්‍රය දේශනා කිරීම
- ★ අචිරවතී නදී තීරයෙහි පිහිටි අඹ වනයෙහි දී තේවිජ්ජ සූත්‍රය දේශනා කිරීම
- ★ විශාලා මහනුවර වන පියසක දී මහා සීහනාද සූත්‍රය දේශනා කිරීම
- ★ ලෙහෙණුන්ගේ අභය භූමියක් වූ කලන්දක නිවාප නම් ස්ථානයේ දී මහා මොග්ගල්ලාන සූත්‍රය දේශනා කිරීම

- ★ ඇට්ටේරියා වනයක දී සිංසපා සූත්‍රය දේශනා කිරීම
- ★ චම්පා නුවර අසල ගග්ගරා පොකුණ සමීපයේ දී සෝණදණ්ඩ සූත්‍රය දේශනා කිරීම
- ★ ජීවක අඹ උයනේ දී සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කිරීම
- ★ මහී ගංගා තීරය අසල සොඳුරු සවස් භාගයේ දී ධනිය ගෝපාල සූත්‍රය දේශනා කිරීම
- ★ කෙත් යායක දී කසී භාරද්වාජ සූත්‍රය දේශනා කිරීම

මේ ආකාරයට දම් සභා මණ්ඩප බවට පත් වූ ස්වාභාවික ස්ථාන රැසක් පිළිබඳ ව තොරතුරු සූත්‍ර පිටකයෙහි දැක්වේ.



පරිසරයේ සොඳුරු බව ඇගයීමට ලක් කළ අවස්ථා,

බුදුරජාණන් වහන්සේ පරිසරයේ සුන්දරත්වය විරාගී ව වර්ණනා කළ අවස්ථා රැසක් ද ධර්ම ග්‍රන්ථවල දැක්වෙයි. උන් වහන්සේ නිතර ඇසුරු කළ රජගහනුවර හා ඒ අවට ස්ථාන කිහිපයක් හඳුන්වා දෙන්නේ මෙසේ ය.

"ආනන්දයෙනි, මේ රජගහනුවර සිත් අලවන සුලු ය, එසේ ම නිග්‍රෝධය සිත්කලු ය. චෞර ප්‍රපාතය සිත්කලු ය. වේභාර පර්වත පාර්ශ්වයෙහි වූ සප්තපර්නී ගුහාව ද සිත්කලු ය. ඉසිගිලි පාර්ශ්වයේ කාලශිලාව ද සිත්කලු ය. ශීතවනයෙහි වූ සප්ප සොණ්ඩික පබ්භාරය ද මනරම් ය. තපෝදාරාමය ද එබඳු ම ය. තව ද කලන්දක නිවාපි නම් වූ වේළුවනයත් මද්දකුච්ඡි නම් වූ මුව වනයත් සිත් ඇදගන්නා සුලු ය. එපරිද්දෙන් ම ආනන්දය, ජීවකයන්ගේ අඹ උයන ද මනරම් ය."

විශාලා මහනුවර පිහිටි සුන්දර ස්ථාන ද වර්ණනයට ලක් වූයේ මේ අයුරිනි. එහි වූ උදේන, ගෝතමක, සත්තම්බක, සාරන්දද ආදී වශයෙන් චෛත්‍ය ස්ථාන ගණනාවක රමණීය බව පෙළ දහමේ දක්වා තිබේ. ඇතැම් විට සරාගී පුද්ගලයෝ මෙබඳු පරිසරයන්හි සුන්දරත්වය නොදනිති. නැතහොත් එබඳු ස්ථාන ඔවුහු නිසරු ක්‍රියාකාරකම් සඳහා යොදාගෙන විනාශ කර දමති. එමෙන් ම විරාගී උතුමන්ට සොඳුරු තැන් සරාගී අය බියකරු ලෙස දකිති. එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ හුදකලාව වනයෙහි වෙසෙන විට දෙවියෙක් පැමිණ මද්දහනෙහි විවේක ගන්නා වූ පක්ෂීන් වෙසෙන මහ හඬක් නගන වනය තමනට බිය උපදවන තැනක් බව පවසයි. නමුත් බුදුරජාණන් වහන්සේ ඔහුට දන්වා සිටියේ තමනට එම පරිසරය සිත් පිනවන සොඳුරු තැනක් බව ය.

බුදුරජාණන් වහන්සේ තුරු ලතාවන්හි, ජල තලාවන්හි, පිරිසිදු වාතයෙහි ආරක්ෂාව තහවුරු වන ලෙස තම ජීවිතය ගත කිරීමෙන් නොනැවතුණහ. පරිසර දූෂණය වළක්වා ගැනීමෙන් සියලු සත්ත්වයන්ගේ ජීවිත සුරක්ෂිත වන අයුරින් කටයුතු කිරීමට යොමු වූහ. අනවශ්‍ය ලෙස උස් හඬින් කථා කරන ප්‍රලාපයන්හි යෙදෙන මිනිසුන් සිටින තැන්වලට වැඩම කිරීම උන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. තම සෙනසුන්වල එබඳු අමිහිරි ලෙස බස හසුරවන පිරිස් විවේචනයට ලක් කළහ. පොට්ඨපාද පිරිවැජියාගේ ආශ්‍රමයට බුදුරජාණන් වහන්සේ වැඩම කරන විට ඔහු සෙසු පිරිවැජියන් නිශ්ශබ්ද කරනු ලැබුවේ උස් හඬින් කතා කළහොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි ප්‍රකාශ කරමිනි. දෙව්රම් වෙහෙරට වැඩම කළ භික්ෂූන් පිරිසක් මහ ශබ්ද නගමින් උස් හඬින් කතා කරන විට කෙවුලන් සේ ඝෝෂා නොකොට ආරාමයෙන් පිට ව යන ලෙසට අවවාද කර ඇත. බොහෝ විට විශාල ශ්‍රාවක පිරිසක් සමග වෙසෙන අවස්ථාවල දී පවා දැඩි නිහඬතාවක් පැවැතුණි. අජාසත් රජතුමා ඇතුළු පිරිස ජීවක අඹ උයනට පැමිණියේ බුදුරජාණන් වහන්සේ මුණගැසීමට ය. ඒ වන විට එහි භික්ෂූන් වහන්සේ එක්දාස් දෙසීයක් පමණ වැඩ සිටියහ. නමුත් මේ පිරිසගෙන් කිවිසුම් හඬක් වත් නොඇසීම නිසා රජතුමා බියට පත් විය. ජීවක වෛද්‍යතුමා බුදු පාමොක් මහා සඟරුවනේ ස්වභාවය ඒ බව පවසා රජුගේ බිය දුරු කර ඇත.


පරිසර පද්ධති තුළ වසන සතුන්ගේ ජීවිත සුරක්ෂිත කළ අවස්ථා ද බුදු සිරිත තුළ කොතෙකුත් දැකිය හැකි ය. ළමුන් පිරිසකගේ හිරිහැරයට ලක් ව සිටි ගැරඬියකු ඉන් ගලවා ගැනීමත්, උදේනි රජතුමාගේ ඇත්හලේ සිට පසු ව නොසලකා හැරීමට ලක් ව සිටි භද්‍රවතිකා ඇතින්නට පුරුදු උවටැන් ලබා දීමට සැලැස්වීම තුළිනුත් ප්‍රකට කළේ ජීව පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීමේ ආදර්ශයයි.

මේ ආකාරයට ලුම්බිණි සල් උයනෙන් දිවි ගමන ඇරඹූ බෝසතාණන් වහන්සේ බෝධිමූලයේ දී බුද්ධත්වයට පත් ව කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවර්තන සල් උයනේ දී පිරිනිවන් පානා තෙක් ස්වාභාවික පරිසරයේ දිවි ගෙවමින් ලෝක සත්ත්වයාට බොහෝ ආදර්ශ සැපයූහ. ඒ අතර පරිසර සුරක්ෂිතතාව, එහි පෝෂණය හා එය දූෂණයෙන් වළක්වා ගැනීමට ලබා දුන් චරිතාදර්ශය සමස්ත මානව පරපුරට ම කියා දුන් පාඩමකි. එම පාඩමෙන් ආදර්ශ ලබාගෙන සියලු සත්ත්වයින් ඇතුළු ජීවී අජීවී පරිසරයට සෙනෙහස, ආදරය දැක්වීමට පුරුදු වෙමු. එවිට හෙට උපදින පරපුරට සොඳුරු පරිසරයක් නිර්මාණය වනු ඇත.



## සාරාංශය

ජීව අජීව වශයෙන් වර්ගීකරණයකට ලක් කෙරෙන ස්වාභාවික පරිසරයේ ආරක්ෂාව තහවුරු කිරීම මිහිතලයේ ම ආරක්ෂාව තහවුරු කිරීමකි. ඒ සඳහා පරිසරයට ආදරය කරන මිනිසුන් බිහි විය යුතු ය. බුදුරජාණන් වහන්සේ එබඳු උතුමෙකි. උන් වහන්සේ නික්ලේශී ව පරිසරයට ඇලුම් කළ ශාස්තෘවරයෙකු බව බෝධිසත්ව චරිතය තුළිනුත්, බුද්ධ චරිතය තුළිනුත්, ඉගැන්වූ දහම තුළිනුත් ප්‍රකට කෙරෙන අවස්ථා බොහෝ නිදසුන් මගින් තහවුරු කළ හැකි ය. මෙහි දී උන් වහන්සේගේ චරිතය පරිසරය පිළිබඳ සුහද සංවේදී ආකල්පයක් අප තුළ උපදවයි.



## ක්‍රියාකාරකම

1. බෝසතුන්ගේ පරිසර හිතකාමී බව ප්‍රකට කෙරෙන අවස්ථා දෙකක් පෙන්වා දෙන්න.
2. බුදුරජාණන් වහන්සේ විසින් ශබ්ද දූෂණය වැළැක්වීමට ක්‍රියා කළ අවස්ථා දෙකක් ලියන්න.
3. 'අ' කොටසට ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරා පිළිතුරට හිමි අංකය වරහන් තුළ යොදන්න.

| අ | | ආ |
|---|---|---|
| 1. නේවාසික ස්ථානයකි | ( ) | 1. කූඨාගාර ලෙන |
| 2. දම්සභා මණ්ඩපයක් බවට පත් වූ තැනකි | ( ) | 2. බෝධි මූලය |
| 3. විවේකී සුවයෙන් ගත කළ අවස්ථාවකි | ( ) | 3. සාරන්දද චෛත්‍යය |
| 4. වස් විසූ ස්ථානයකි | ( ) | 4. නිග්‍රෝධ උයන |
| 5. වර්ණනාවට ලක් වූ ස්ථානයකි | ( ) | 5. කලන්දක නිවාපය |



## පැවරුම

බුද්ධ චරිතය තුළින් පරිසර සුරක්ෂිතතාවට ගත හැකි ආදර්ශ නමින් විදුහලේ බෞද්ධ ශිෂ්‍ය සංගමයට ඉදිරිපත් කරන කතාවක පිටපතක් ලියන්න.